**<u>දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම - අම්පාර</u>**
**<u>රැස්වීම් වාර්තාව</u>**

**01.** දිනය :- 2023.11.30 වේලාව :- පෙ.ව. 09.30

**02.** ස්ථානය :- ඒ.අයි. වික්‍රම ශ්‍රවණාගාරය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර.

**03.** ප්‍රධානත්වය :- දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවර ගරු සෙන්දිල් තොන්ඩමාන් මැතිතුමා, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඩබ්.ඩී. වීරසිංහ මැතිතුමා, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ඒ.එල්.එම්. අතාවුල්ලා මැතිතුමා

**04.** මෙහෙයවීම :- දිස්ත්‍රික් ලේකම් චින්තක අබේවික්‍රම මහතා

**05.** සහභාගීත්වය :- මෙම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම සඳහා සහභාගී වූ දේශපාලන අධිකාරිය, නැගෙනහිර පළාත් සභාවේ හා දිස්ත්‍රික්කයේ සියලුම ආයතන නියෝජනය කරමින් පැමිණි නිළධාරීන් සහ ආරක්ෂක අංශවල ප්‍රධානීන්ගේ පැමිණීමේ ලේඛනය අමුණා ඇත. (ඇමුණුම 1)

**06. පිළිගැනීම හා අරමුණ පැහැදිලි කිරීම.**

දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිතුමන් විසින් දිස්ත්‍රික් සම්බන්ධිකරණ කමිටුව අමතමින්, පැමිණ සිටි දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවර ගරු සෙන්දිල් තොන්ඩමාන් මැතිතුමා, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඩබ්.ඩී. වීරසිංහ මැතිතුමා, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මැතිතුමා, සියළුම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, නැගෙනහිර පළාත් සභාවේ ප්‍රධාන ලේකම් ඇතුළු පළාත් සභාව නියෝජනය කරමින් පැමිණි හා දිස්ත්‍රික්කයේ සියලුම ආයතන නියෝජනය කරමින් පැමිණි නිළධාරීන් ඉතා සුහඳව පිළිගන්නා ලදී. අනතුරුව ගරු. සමසභාපතිවරුන් වෙත දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ කටයුතු ඉදිරියට පවත්වාගෙන යාම සඳහා භාර දෙන ලදී.

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඩබ්.ඩී. වීරසිංහ මැතිතුමා විසින් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවර ගරු සෙන්දිල් තොන්ඩමාන් මැතිතුමා, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මැතිතුමා, සියළුම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, දිස්ත්‍රික් ලේකම් ඇතුළු සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්ට, සියළුම ආයතන ප්‍රධානීන්ට, සියළුම ආරක්ෂක අංශවල ප්‍රධානීන්ට සහ අම්පාර දිස්ත්‍රික්කයේ සියළු රාජ්‍ය නිළධාරීන් පිළිගෙන ජාතික මට්ටමින් ක්‍රියාත්මක අලුත් ගමක් අලුත් රටක් සංවර්ධන වැඩසටහන හා ආහාර සුරක්ෂිතතා වැඩසටහන පිළිබඳ ප්‍රගතිය සමාලෝචනයට සහ 2023/2024 මහ කන්නයේ වගා කටයුතු පිළිබඳ දැනුවත් කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම්තුමන් වෙත ආරාධනා කරන ලදී.

**07.** ජාතික මට්ටමින් ක්‍රියාත්මක අලුත් ගමක් අලුත් රටක් සංවර්ධන වැඩසටහන හා ආහාර සුරක්ෂිතතා වැඩසටහන පිළිබඳ ප්‍රගතිය සමාලෝචනය.

**7.1 2023/2024 මහ කන්නයේ වගා කටයුතු පිළිබඳ දැනුවත් කිරීම.**

මහ කන්නයේ වගා කටයුතු සැලැස්ම දිසාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලදී. මෙවර මහ කන්නයේ ගොවිජන සේවා දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව යන සියළු දෙපාර්තමේන්තුවල වගා ඉලක්කය වූයේ හෙක්ටයාර 87994.7 බව පැවසීය. මේ වන විට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ දත්ත අනුව වගා කළ ප්‍රමාණය හෙක්ටයාර 83775.9 බව පැවසීය. එය වගා ඉලක්කයෙන් 95.2% බවත් ඉතිරි කුඩා කුඹුරු වගා කිරීමෙන් පසු වගා ඉලක්කය සපුරාලිය හැකි බවත් පැවසීය. මෙවර ගොවීන්ට හෙක්ටයාර 1ක් සඳහා උපරිමය රු.15,000.00ක් සහ හෙක්ටයාර 2ක් සඳහා රු.30,000.00ක සහනාධාර වශයෙන්

ලබා දෙන බවත්, මේ වනවිට එයින් යම් කොටසක් ගොවීන්ගේ ගිණුම් වෙත බැර කර ඇති බවත්, ඉතිරිය මුදල් ලැබෙන ආකාරයට ගිණුම් ගත කරන බවත් සඳහන් කරන ලදී. පොහොර ලබාදීමේදී ගොවීන්ගේ වච්චර්පත් සඳහා පුද්ගලික අංශයට රුපියල් මිලියන 182ක් ගෙවීමට ඇති බවත්, මේ වන තෙක් ඒ සඳහා මහා භාණ්ඩාරයෙන් මුදල් ලබා දී නොමැති බවත්, මුදල් ලැබුණු වහාම ගෙවීම් සිදුකරන බවත් සඳහන් කරන ලදී. ගොවීන්ට අවශ්‍ය පොහොර ගොවිජන සේවා දෙපාර්තමේන්තුවෙන්ද විවෘත වෙළෙඳපොලෙන් ද ලබා ගැනීමට හැකියාව ඇති බව සඳහන් කරන ලදී.

**08. ජාතික භෞතික සැලැසුම් දෙපාර්තමේන්තුව මගින් සකස් කළ ජාතික භෞතික සැලැස්ම 2048 යටතේ අම්පාර දිස්ත්‍රික්කයේ පළාත් පාලන කොට්ඨාශ මට්ටමින් හඳුනාගත් යෝජනා ඉදිරිපත් කිරීම.**

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පැමිණ සියළු දෙනා පිළිගෙන ජාතික භෞතික සැලැස්ම 2048 යටතේ අම්පාර දිස්ත්‍රික්කයේ හඳුනාගත් යෝජනා සම්බන්ධයෙන් අම්පාර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව දැනුවත් කිරීමට අවස්ථාව ලබාදීම සම්බන්ධයෙන් ස්තුතිය ප්‍රකාශ කරන ලදී. අතිගරු ජනාධිපතිතුමා ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ සභාපති වශයෙන් රටේ ප්‍රශස්ථ සංවර්ධනය නිවැරදි දිශානතියකට යොමුකිරීමේ අරමුණින් මෙම සැලසුම් සකස්කර ඇති බව සභාවට දන්වන ලදී. රටේ සියළුම අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු විසින් ඉදිරි සංවර්ධන සැලසුම් සකස් කිරීමේදී මේ අනුව කටයුතු කල යුතු බව ද දන්වන ලදී. ඉන්පසු මේ සම්බන්ධයෙන් සකස් කළ ඉදිරිපත් කිරීමක් (power point presentation) කමිටුවට ඉදිරිපත් කරන ලදී. මේ අනුව යම් වෙනස්කම් සිදුවිය යුතුනම් ඒ සම්බන්ධයෙන් දැනුම් දෙන ලෙස ද ඉල්ලා සිටියහ. (ඇමුණුම 2)

**09. දිස්ත්‍රික් මට්ටමින් විදේශ ප්‍රතිපාදන මත ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහන් පිළිබඳ ප්‍රගතිය සමාලෝචනය**

**9.1 දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය (CSIAP)**

මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පවතින ගැටළු දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු විමලවීර දිසානායක මැතිතුමා විසින් විමසන ලදී. මෙහිදී ලාහුගල, හුලංනුගේ ප්‍රදේශවල වැව් වල වැඩ අවසන් නොමැති බවත්, පාරවල් සියල්ල මඩ වී ඇති බවත්, වැව්වල ජලය නොමැති බවත්, විනාශයක් පමණක් මෙම ව්‍යාපෘතිය මගින් සිදු කර ඇති බව කමිටුවට ප්‍රකාශ කරන ලදී. ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් මේ වන විට ප්‍රතිසංස්කරණ කටයුතුවලින් 75% පමණ අවසන් බවත්, කරඳ වැව හැර අනෙක් සියළු වැව් වල කටයුතු දෙසැම්බර් මස 15 වනවිට අවසන් කරන බවත් සභාවට දැනුම් දෙන ලදී. මේ වනවිට වැව් සියල්ල පිරී ගොවීන් විසින් මෙම කන්නයේ වැඩ ආරම්භ කර ඇති බවත් දන්වන ලදී. මෙහිදී ලාහුගල ප්‍රාදේශීය ලේකම් විසින් ප්‍රදේශයේ ගොවි සංවිධාන වල නියෝජිතයන් විසින් නිතර මේ සම්බන්ධයෙන් පැමිණිලි කරන බව ද ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීම්වලදී මේ සම්බන්ධයෙන් විමසීමේදී පිළිතුරු දීමට කිසිම අයෙක් නොමැති බව ද දැන්වීය. මෙහිදී දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු විමලවීර දිසානායක මැතිතුමා විසින් ව්‍යාපෘති අධ්‍යක්ෂට 2023.12.06 දින එතුමා සමඟ එම ප්‍රදේශයේ ක්ෂේත්‍ර චාරිකාවක් සඳහා සහභාගීවන ලෙස දැන්වීය.

**9.2 වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක දේශගුණික අවබලපෑම් අවම කිරීමේ බහු අදියර වැඩසටහනට (CresMPA) අදාළ ව්‍යාපෘති**

මෙම වැඩසටහනට අදාළ ව්‍යාපෘති වල මේ වනවිට ප්‍රගතිය හා වැඩකටයුතු පිළිබඳව වාරිමාර්ග අධ්‍යක්ෂ හා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු නියෝජ්‍ය කොමසාරිස් විසින් පැහැදිළි කරන ලදී.

**9.3 වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ඒකාබද්ධ ජලධාරා හා ජලසම්පත් කළමණාකරණ ව්‍යාපෘති (IWWRMP)**

මෙම වැඩසටහනට අදාලව දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘති තුන සඳහා ප්‍රතිපාදන මෙම වැඩසටහන යටතේ ලබාදිය නොහැකි බවත් එම ව්‍යාපෘති සඳහා මහවැලි අධිකාරියෙහි ප්‍රතිපාදන යොදා ගන්නා ලෙසත් වාරිමාර්ග අමාත්‍යාංශය විසින් දැනුම් දී ඇති බව මහවැලි සී කලාපයේ නේවාසික ව්‍යාපාර කළමනාකාර විසින් සඳහන් කරන ලදී.

මේ සම්බන්ධව විශේෂයෙන් සොයා බැලීමට කටයුතු කරන බව දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු විමලවීර දිසානායක මැතිතුමා විසින් සඳහන් කරන ලදී.

**10. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබා ගත යුතු යෝජනා**

| අනු අංක | යෝජනාව | තීරණය |
|---|---|---|
| 01 | රඹකැන්ඔය ප්‍රධාන අපවහන ඇල ශුද්ධ පවිත්‍ර කිරීමේ ව්‍යාපෘති යෝජනාව බහු අදියර වැඩසටහන් (CresMPA) ව්‍යාපෘතියට පෙර ඇතුලත්ව ඇති නමුත් එය ක්‍රියාත්මක නොවීම නිසා නැවත එය බහු අදියර වැඩසටහන් (CresMPA) ව්‍යාපෘතිට ඇතුලත් කිරීමට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු අනුමැතිය ලබා ගැනීම. | කමිටු අනුමැතිය ලබා දෙන ලදී. 2024 වසරේ ව්‍යාපෘති සඳහා ඇතුළත් කිරීමට තීරණය කරන ලදී. |
| 01 | පානම සංචාරක කලාපය තිරසර සංචාරක ආකර්ෂණ මධ්‍යස්ථානයක් බවට වැඩිදියුණු කිරීම සඳහා විනෝදාස්වාදජනක ක්‍රියාකාරකම් සහ ත්‍රාසජනක සංචාරක ක්‍රියාකාරකම් ස්ථාපිත කිරීම සඳහා වන ව්‍යාපෘති යෝජනාවට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු අනුමැතිය ලබා ගැනීම. | අදාළ ආයතනවල නිර්දේශයන් ලබාගැනීමට යටත්ව මේ සඳහා කමිටු අනුමැතිය ලබා දෙන ලදී. |

**11. ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කර විසඳුම් නොලැබුණු විශේෂ ගැටළු**

| අනු අංක | යෝජනාව | තීරණය |
|---|---|---|
| 01. | කිලෝමීටර් ලක්ෂයේ ව්‍යාපෘතියේ සහ අයිරෝඩ් ව්‍යාපෘතිය යටතේ සක්‍රිය කාලයේ වැඩ ආරම්භ කර සහ ABC අතුරා ඇති මාර්ග වල සංවර්ධන කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා අම්පාර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබා ගැනීම. | අනුමැතිය ලබාදුන් අතර එම සංවර්ධනය කළයුතු මාර්ගවල තොරතුරු ඇතුළත් වාර්ථාවක් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ මන්ත්‍රීවරුන් වෙත ලබාදීමට කටයුතු කිරීමට තීරණය විය. |
| 02. | අම්පාර දිස්ත්‍රික්කය තුල කෘෂි නිෂ්පාදන වැඩිදියුණු කිරීමට වැව් සහ ජලාශ සංවර්ධනය කිරීම පිළිබඳව සාකච්ඡා කිරීම. | වැව් ප්‍රතිසංස්කරණය කිරීම අදාළ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු වල අනුමැතිය මත ක්‍රියාත්මක කිරීමට තීරණය විය. |
| 03. | අක්කරපත්තු පල්ලිකුඩියිරුප්පු ප්‍රදේශයේ පිහිටි අස්සෆා විද්‍යාලයේ තිබෙන වංචා හා දූෂණ පිළිබඳව විමර්ශන කමිටුවක් පත්කර පවතින ගැටලු විසඳා දෙන ලෙස ඉල්ලීම. (පල්ලිකුඩියිරුප්පු ජුම්මා මහ පල්ලිය විසින් කරන ලද ඉල්ලීම) | මෙය ආරම්භයේ භාවිතා කල නම ගැසට් පත්‍රයක් මගින් වෙනස් නොකල නිසා එම නාමයම භාවිතයට ගැනීම හා මේ පිළිබඳ පළාත් ලේකම්ගේ ප්‍රධානත්වයෙන් සහ අම්පාර දිස්ත්‍රික් ලේකම්ගේ සහභාගීත්වයෙන් කමිටුවක් පත්කර විමර්ශනයක් සිදුකර වාර්තාවක් නැගෙනහිර පළාත් ආණ්ඩුකාර ගරු සෙන්දිල් තොන්ඩමාන් මැතිතුමාට ලබා දීමට තීරණය විය. |
| 04. | උල්ල "කුඩා" ප්‍රදේශයේ මහජනාතවගේ ඉඩම් ලෙස අධිකරණය මගින් තීන්දු ලබා දී ඇති ඉඩම් මහජනතාව සඳහා ලබා දීමට කටයුතු කිරීම | අම්පාර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනු කමිටුවක් මගින් මෙම කලාපය අධිසංවේදී කලාපයක් ලෙස හදුනාගෙන වාර්ථාවක් නිකුත්කර එම වාර්ථාව අම්පාර දිස්ත්‍රික් සමබන්ධීකරණ කමිටුව විසින් අනුමත කර ඇති බැවින් මෙම තීරණය වෙනස් කිරීමට අවශ්‍ය වන්නේ නම් ඊට අදාළ ඉදිරි කටයුතු සදහා යොමු වන ලෙස දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී මුෂාරෆ් මැතිතුමාට දැන්වීය. |
| 05. | දෙහිඅත්තකණ්ඩිය,නො.172, මුරුතගස්පිටිය යන ස්ථානයේ මාර්ගයේ ස්ථාපිත කොට ඇති අනවසර ඉදිකිරීම ඉවත් කිරීම සම්බන්ධවයි. | මාර්ගය අසල අනවසරව ඉදිකර ඇති මෙම තාවකාලික ඉදිකිරීම ඉවත් කර වෙනත් සුදුසු විකල්ප ස්ථානයක් ලබාදීමට කටයුතු කර ඊළග දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමට පෙර විසඳීමට මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවට දැනුම් දෙන ලදී. |

| | | |
|---|---|---|
| 06. | අම්පාර නගර සභාවට අයත් කසළ බැහැර කිරීමේ ස්ථානයේ එකතුවී ඇති කසළ Uniliver සමාගම සමඟ එක්ව ඉවත් කිරීම සම්බන්ධව යෝජනාව | Uniliver ආයතනය මෙන්ම කාබනික පොහොර නිෂ්පාදනය කරන ආයතන මගින් ද සහාය ගෙන කඩිනමින් අදාළ කසල ඉවත්කිරීමට කටයුතු සිදු කරන ලෙස දන්වන ලදී. |
| 07. | දෙහිඅත්තකණ්ඩිය, මැදගම නගරයේ පිහිටි පැරණි තැපැල් කාර්යාල ගොඩනැගිල්ල ප්‍රාදේශීය සභා පුස්තකාලයක් ස්ථාපිත කිරීමට ප්‍රාදේශීය සභාව වෙත ලබා ගැනීම. | වෙනත් ඉඩමක් පුස්තකාලය ස්ථාපිත කිරීම සඳහා සොයා ගැනීමට තීරණය විය. |
| 06. | පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් උප කාර්යාලයක් දෙහිඅත්තකණ්ඩිය ප්‍රදේශයේ ස්ථාපිත කිරීම. | පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් උප කාර්යාලයක් ස්ථාපිත කිරීම අත්‍යාවශ්‍ය නොවන බවත් හා පළාත් කෘෂිකර්ම ව්‍යාපෘති මහවැලි අධිකාරිය හරහා ක්‍රියාත්මක කිරීමට හැකිබවත් දැන්විය. |
| 09. | වකුගඩු රෝගීන් හඳුනා ගැනීමේ සායන වැඩසටහන අක්‍රිය වීම. | මෙම සායනය අක්‍රිය වීමට හේතු ලෙස, පරීක්ෂා කිරීම් සඳහා අවශ්‍ය රසායන ද්‍රව්‍ය නොමැතිකම, ලබා දී තිබූ වාහනය අලුත් වැඩියා කිරීමට සිදුවීම, එයට අනුයුක්තව සේවය කල වෛද්‍යවරිය ප්‍රසූත නිවාඩු යෑම සහ සේවක හිඟතාව බව පෙන්වා දුනි. එහිදී වාහනය අලුත් වැඩියා කිරීමට අවශ්‍ය මුදල වන රුපියල් ලක්ෂ 11 මුදල ලබාදීමට නැගෙනහිර පළාත් ප්‍රධාන ලේකම් එකඟ වීමත්, ප්‍රසූත නිවාඩු ලැබූ වෛද්‍යවරිය ජනවාරි මස නැවත සේවයට පැමිණෙන හෙයින් දෙහිඅත්තකණ්ඩිය රෝහලෙන් සේවකයන් ලබා දීම මගින් මෙම සායනය නැවත ඇරඹීමට කටයුතු කලහැකි බව අම්පාර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ පවසන ලදී. ඒ අනුව මෙම සායනය නැවත ආරම්භ කිරීමට තීරණය කරන ලදී. |
| 10. | රොට්ට වැවෙන් වැලි ලබා ගැනීමට අනුමැතිය ලබා ගැනීම. | අනුමැතිය ලබාදෙන ලදී. මෙවැනි ඉල්ලීම් සඳහා අදාළ ආයතන මගින් විධිමත් අවසර ගෙන ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු අනුමැතිය ලබා ගැනීම ප්‍රමාණවත් බව ගරු ඩබ්.ඩී. වීරසිංහ මැතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී. |
| 11. | බෝගමුයාය පාසල අසල අලිමංකඩක් පිහිටා ඇති නිසා පාසල් ළමුන්ගේ හා ගුරුවරුන්ගේ ජීවිතවලට තර්ජනයක් ඇති වීමට ඉඩ ඇත. | වනජීවී දෙපාර්තමේන්තුව විසින් මේ සඳහා යෙදවීමට සේවකයන් නොමැති බව පැවසීය. මෙය පාසලක් අසල පවතින උග්‍ර ගැටළුවක් බැවින් වෙනත් ස්ථානයක සිටින සේවකයෙකු හෝ යෙදවීමට කමිටුව විසින් උපදෙස් ලබාදෙන ලදී. |
| 12. | අරන්තලාව ග්‍රාම නිලධාරී වසමේ වන අලි ගම්වැදීම නිසා වගාවන් විනාශ වීම හා මිනිස් ජීවිත වලට තර්ජන ඇතිවීම. | අදාළ අලිවැට කඩිනමින් නවීකරණය කරදීමට කටයුතු කරන බව වනජීවී දෙපාර්තමේන්තුව විසින් සඳහන් කරන ලදී. |
| 13. | බුදුරාපොත-රඹකැන්ඔය යෝජිත අලිවැට ඉදිකිරීමේදී කිරලගොඩ කැළෑ කොටස ද ගමට ඇතුලත්වන ලෙස අලි වැට ඉදි කරන ලෙස ගම්වාසීන් ඉල්ලා සිටීම. | මෙලෙස කැලෑ කොටස් ඇතුල්කර අලිවැට ඉදිකල නොහැකි බව වනජීවී දෙපාර්තමේන්තුව විසින් සඳහන් කරන ලද අතර එම කරුණ ගරු ඩබ්.ඩී. වීරසිංහ මැතිතුමා විසින් ද අනුමත කරන ලදී. |
| 14. | දිවුලපතාන ගමෙන් අම්පාර දිස්ත්‍රික්කයට අයිති කොටස නිවරදිව හඳුනා ගැනීම. | මෙම ගැටළුව සම්බන්ධව මඩකලපුව දිස්ත්‍රික් ලේකම් ඇතුළු නිළධාරීන් සමග අම්පාර දිස්ත්‍රික් ලේකම් ඇතුළු නිලධාරීන් එක්ව සාකච්ජා කිරීමට තීරණය විය. |
| 15 | I-Road ව්‍යාපෘතිය මගින් මහඔය කොට්ඨාශයේ නිම කර ඇති මාර්ගවල පවතින අඩුපාඩු නිවැරදි කරදෙන ලෙස ඉල්ලීම (මහඔය - නිල්ඔබ හා මහඔය - කොඩිතුවක්කුතලාව මාර්ග) | ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් මෙම මාර්ගවල වැඩ අවසන් කර ප්‍රාදේශීය සභාවට භාරදී ඇති බව පැවසීය. නමුත් මාර්ගවල අඩුපාඩු ඇත්නම් ඒවා සකස්කර දෙන ලෙස කමිටුව විසින් දන්වන ලදී. |
| 16 | ඔලුවිල් හා පාලමුනේ යන ප්‍රදේශ දෙකටම උප්පැන්න මරණ රෙජිස්ට්‍රාර් එක් අයෙකු පමණක් සේවයේ ඇති බැවින් රාජකාරී කටයුතු ඉටුකර ගැනීමේදී පොදු ජනතාව මහත් අපහසුතාවයන්ට පත්වීම හේතුවෙන් | මේ සඳහා කමිටු අනුමැතිය ලබා දෙන ලදී. |

| | | |
|---|---|---|
| | ඒ සඳහා වෙන වෙනම නිලධාරීන් පත් කිරීම. | |
| 17 | අක්කරපත්තුව ගමනාගමන මණ්ඩලයට වෙන් කරන ලද අක්කර 07ක ඉඩම් සම්පූර්ණයෙන්ම එම මණ්ඩලයට ලබා දෙන ලෙස ඉල්ලීම. | මේ සම්බන්ධ සියළු ලියවිලි හා තොරතුරු මීලග දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව වෙත ඉදිරිපත් කරන ලෙස අක්කරපත්තුව ප්‍රදේශීය ලේකම් වෙත දැනුම් දෙන ලදී. |
| 18 | ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වැව් ප්‍රතිසංස්කරණයට ලබා දුන් කාලය තුළ නිම නොකිරීම හේතුවෙන් ගොවීන්ට දැනට ඇතිවී ඇති ගැටළු හා ඉදිරියේදී මුහුණදීමට තිබෙන ගැටළු සම්බන්ධව තීරණ ගැනීම. | මෙම වැව්වල අඩුපාඩු සොයා බලා සකස් කිරීමට වාරිමාර්ග අධ්‍යක්ෂට උපදෙස් දෙන ලදී. |
| 19 | ලාහුගල මහ වැව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ඇස්තමේන්තු සකසා ලබාදුන්නද එය ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වැව් ප්‍රතිසංස්කරණයට ඇතුළත් කර නොමැත. | මෙම ව්‍යාපෘතිය යටතේ ලාහුගල මහ වැව ප්‍රතිසංස්කරණය සිදුකිරීමට අනුමැතිය ලැබී නොමැති බැවින් ඉදිරි වසරේ ක්‍රියාත්මක වන වෙනත් ව්‍යාපෘතියක් යටතේ මෙය ඉටුකර ගැනීමට කටයුතු කරන ලෙස ලාහුගල ප්‍රාදේශීය ලේකම් වෙත දන්වන ලදී. |
| 20 | පොතුවිල් සෙන්ගමුව ඔරුකාමලේ ප්‍රදේශයේ මහජනතාවගේ පරිහරණයට ප්‍රාදේශීය ලේකම් විසින් නිදහස් කර ඇති ඉඩම වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ බලපෑමකින් තොරව භාවිතයට ගැනීමට මහජනතාවට අවසර ලබා දීම.(තිරුක්කෝවිල් ප්‍රා.ලේ. කොට්ඨාශය) | මේ පිළිබඳ ඉදිරි සාකච්ඡා වාරයක් පවත්වා ගැටළු නිරාකරණය කිරීමට තීරණය විය. |
| 21 | මාර්ග සහ ගොඩනැගිලි ඉදිකිරීමේ කටයුතු මේ වන විට ආරම්භ කර ඇති බැවින් ඒ සඳහා අවශ්‍ය ගල්, මැටල් ආදී අමුද්‍රව්‍ය වල දැනට පවතින හිඟතාවය තුරන් කිරීම සඳහා ගල් කොරි සඳහා අනුමැතිය ලබා ගැනීම. | ගල්කොරි සඳහා අවසර ලබාදීමට හැකියාව ඇත්නම් හා ඒ සඳහා පවතින අවශ්‍යතාව මත ඊලඟ තිරුක්කෝවිල් ප්‍රා.සම්බන්ධීකරණ කමිටුවේදී තීරණයක් ගැනීමට තීරණය විය. |
| 22 | ඔකඳ දේවාල භූමියේ ඇති පැරණි ගොඩනැගිල්ල අළුත්වැඩියා කොට ජංගම වෛද්‍ය සේවා කාර්යාලයක් ස්ථාපිත කිරීමට අනුමැතිය ලබා ගැනීම. | පළාත් ලේකම් විසින් මේ සඳහා ගිවිසුමක් සකස්කර ඒ අනුව දෙපාර්ශවය අතර ගිවිසුම්ගත වී ඉදිරි කටයුතු සිදු කරන ලෙස කමිටුව විසින් දැනුම් දෙන ලදී. |

**12. සාකච්ඡා කළ වෙනත් යෝජනා**

**12.1** අම්පාර - කොළඹ ලංකා ගමනාගමන මණ්ඩල බස්රථය මේ වනවිට ධාවනයේ නොයෙදවීම. - ලංකා ගමනාගමන මණ්ඩල නිළධාරියෙකු කමිටුව සඳහා සහභාගී නොවූ හෙයින් ඒ පිළිබඳ ඔවුන් වෙත ලිඛිතව දැනුම් දිය යුතු බව කමිටු සමසභාපති ඩබ්.ඩී. වීරසිංහ මැතිතුමා විසින් සඳහන් කරන ලදී.

**12.2** පානම බහුකාර්යය ගොඩනැගිල්ල අළුත්වැඩියාව හා ඊට අවශ්‍ය උපකරණ මිලදී ගැනීම - මේ සඳහා කමිටු අනුමැතිය ලබා දෙන ලදී.

**13. ස්තුති කථාව :**

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඩබ්.ඩී.වීරසිංහ මැතිතුමා විසින් පැමිණි සිටි සියලුදෙනාට ස්තුතිය පළකර රැස්වීමේ කටයුතු අවසන් කරන ලදී.

චින්තක අබේවික්‍රම
දිස්ත්‍රික් ලේකම්
අම්පාර.

චින්තක අබේවික්‍රම
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
අම්පාර දිස්ත්‍රික්කය

## දිස්ත්‍රික් සම්බන්ධීකරන කමිටු රැස්වීම - අම්පාර දිස්ත්‍රික්කය

දිනය - **2023.11.30**

| අංකය | නම | තනතුර | ආයතනය |
|---|---|---|---|
| 1 | සෙන්තිල් තොන්ඩමන් | ආණ්ඩුකාරවර | |
| 2 | ඩබ්.ඩී.වීරසිංහ | පාර්ලිමේන්තු මන්ත්‍රී | |
| 3 | ඒ.එල්.එම්.අතාවුල්ලා | පාර්ලිමේන්තු මන්ත්‍රී | |
| 4 | වෛද්‍ය තිලක් රාජපක්ෂ | පාර්ලිමේන්තු මන්ත්‍රී | |
| 5 | ඩබ්. දිසානායක | පාර්ලිමේන්තු මන්ත්‍රී | |
| 6 | එස්.එම්.එම්.මුෂාරෆ් | පාර්ලිමේන්තු මන්ත්‍රී | |
| 7 | චන්ද්‍රදාස ගලප්පත්ති | පලාත්සභා සභාපති | |
| 8 | ආර්.එම්.පී.එස්. රත්නායක | ප්‍රධාන ලේකම් නැ/ප | |
| 9 | චින්තක අබේවික්‍රම | දිසාපති | |
| 10 | ටී.එම්.ඒම්. අන්සාර් | ප්‍රාදේශීය ලේකම් | අක්කරපත්තු |
| 11 | වයි.පපාකරන් | ප්‍රාදේශීය ලේකම් | අලයාඩිවෙම්බු |
| 12 | යූ.පී. සදරුවන් අනුරුද්ද | ප්‍රාදේශීය ලේකම් | අම්පාර |
| 13 | ඒ.එම්.ඒ.කුමාරි | ප්‍රාදේශීය ලේකම් | දමන |
| 14 | එස්.ටී.පී.වීරසිංහ | ප්‍රාදේශීය ලේකම් | දෙහිඅත්තකණ්ඩිය |
| 15 | එම්.එස්.එම්. රෂාන් | ප්‍රාදේශීය ලේකම් | ඉරක්කාමම් |
| 16 | ජේ.ලියාකත් අලි | ප්‍රාදේශීය ලේකම් | කල්මුණ |
| 17 | එස්.ජෙගරාජන් | ප්‍රාදේශීය ලේකම් | කාරතිවු |
| 18 | තිලින වික්‍රමරත්න | ප්‍රාදේශීය ලේකම් | මහඔය |
| 19 | රාහුලනායහි | ප්‍රාදේශීය ලේකම් | නාවිතන්වෙලි |
| 20 | ඒ.එම්.අබ්දුල් ලතීෆ් | ප්‍රාදේශීය ලේකම් | නින්දවූර් |
| 21 | බී.වී.එස්. ගුණසේන | ප්‍රාදේශීය ලේකම් | පදියතලාව |
| 22 | එම්.අයි. ෆෙමිස් | ප්‍රාදේශීය ලේකම් | පොතුවිල් |
| 23 | ඒ.එම්.ආසික් | ප්‍රාදේශීය ලේකම් | සායින්දමරුදු |
| 24 | එස්.එල්.එම්.හනිෆා | ප්‍රාදේශීය ලේකම් | සමන්තුරෙයි |
| 25 | චින්තන උදාර නානායක්කාර | ප්‍රාදේශීය ලේකම් | උහන |
| 26 | එන්.නවනීතරාජා | ප්‍රාදේශීය ලේකම් | ලාහුගල |
| 27 | ටී.ජේ.අදිෂයිරාජ් | ප්‍රාදේශීය ලේකම් | කල්මුණ උතුර |
| 28 | එම්.ඒ.සී.ඒ.ෂාෆිර් | ප්‍රාදේශීය ලේකම් | අඩ්ඩාලච්චේන |
| 29 | ටී.ගජේන්ද්‍රන් | ප්‍රාදේශීය ලේකම් | තිරුක්කෝවිල් |
| 30 | පී.කේ.නානායක්කාර | SEAE | GOPL |
| 31 | අයි.ඒ.එම්.පී.ගුණවර්ධන | SEAE | GOPL |
| 32 | එස්.එම්.එම්.එස්. උමාර් මව්ලා | ZDE | අධ්‍යාපන |
| 33 | පී.එස්.නිමල් ජයසිර | RPM -L | MASL |
| 34 | එස්.සතීෂ් කුමාර් | AD | AIB |
| 35 | අලියාර් මොහිදීන් | DYSO | NYSC |
| 36 | එච්.කේ කුමාරසිරි | SL Army | |
| 37 | සුදත් ගමගේ | DI | වාරිමාර්ග |
| 38 | ආර්.එම්.විජයපාල | දිසා වන නිළධාරී | දිසා වන කාර්යාලය |
| 39 | ආර්.ඥාණවෙල්වම් | DPD | ASMP |
| 40 | එන්.මතිවානන් | කොමසාරිස් | |
| 41 | ඒ.එම්.උවයිස් | PE | RDA |
| 42 | බී.එල්.පී.යූ.සිල්වා | ජ්‍යෙෂ්ට මිනින්දෝරු අධිකාරි | මිනින්දෝරු දෙපාර්තමේන්තුව |
| 43 | ඩබ්.සමන්ත කුමාර | සහකාර අධ්‍යක්ෂ | කෘෂිකර්ම |
| 44 | එස්.එෆ්.ඩී.ඩබ්.කුමාර | වාරිමාර්ග ඉංජිනේරු | වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| 43 | ඩබ්.යූ.සී. අනුර් කුමාර | ARM | වී අලෙවි මණ්ඩලය |

| | | | |
|---|---|---|---|
| 46 | කේ.ඒ.නලින් | ACCD | Co-op |
| 47 | ඩී.එම්.ඒ.පී.දසනායක | ECPL 764 | සුරාබදු දෙපාර්තමේන්තුව |
| 48 | ඩී.එම්.ඒ.ඩබ්.කුමාර | Wildlife Ranger | DWC |
| 49 | ආර්.එම්.බී.එම්. චතුරංග | EO | NADDA |
| 50 | එම්.ඒ.ඉර්ෂාඩ් | Dept Manager | SLTB |
| 51 | ඩී.කේ.ඒ.පුෂ්පකුමාර | Dep Sup | තැපැල් |
| 52 | බී.එම්.එම.එම්. දමයන්ති | සංවර්ධන නිළධාරී | සමාජසේවා |
| 53 | එස්.එම්.සුගත් | රියදුරු | RDHS |
| 54 | එස්.ජීවන් | Driver | RDHS Kalmunai |
| 55 | පී.මතිවානන් | සභාපති | EPTB |
| 56 | ඒ.පී.අයිරාංගනී | දිස්ත්‍රික් කළමණාකරු | නිවාස අධිකාරිය |
| 57 | එන්.තමිල් වෙල්වන් | DCS Planning | Planning |
| 58 | එම්.ඒ. මතීව් | AP &TS EP | PD |
| 59 | ඉංජී. ජී. සුජිත්‍රන් | නියෝජ්‍ය අධ්‍යක්ෂ | පලාත් වාරිමාර්ග |
| 60 | ඉංජී. ඒ.රාජේෂ්කන්නා | P/IE | පලාත් වාරිමාර්ග |
| 61 | එම්.එස්.නෆීස් මොහොමඩ් | DDE - Planning | ZEO |
| 62 | ආර්.අබිරිතන් | | Fisheries |
| 63 | පී.රාසමානික්කන් | CE | RDD |
| 64 | කේ.යෝගනාදන් | TO | RDD |
| 65 | ජේ.ඒ.සුදත් | සභාපති | PSEB |
| 66 | ඒ.ඒ.රෂාක් | ප්‍රධාන ඉංජිනේරු | ගොඩනැගිලි |
| 67 | එස්.සුතාහරන් | PD/Fish | ධීවර |
| 68 | වී.කරුනානාතන් | PD/Road | RDD |
| 69 | එම්.එම්.මුනාස් | EE/Road | RDD |
| 70 | අයි.කේ.යු.මුතුබණ්ඩා | Sec/MOA | |
| 71 | කේ.සී.එම්.මුසාම්මිල් | ALL | Provincial Land |
| 72 | ඉංජී.එයි.ඒ.අකිල් | A/IE | P/ID |
| 73 | එන්.තනංජයන් | PD | Rural Development |
| 74 | වී.රාජගෝපාල් | PD | P/D EP |
| 75 | එස්.බී.දිසානායක | DDA | කෘෂිකර්ම |
| 76 | එම්.එස්.ඒ.කලීස් | පලාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |
| 77 | වෛද්‍ය.ඩී.ජී.එම්.කොස්තා | PDHS | Health |
| 78 | එල්.ජී.වාමිනී සෝමදාස | නියෝජ්‍ය කොමසාරිස් | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |
| 79 | එන්. මන්වානන් | ලේකම් | CM |
| 80 | කේ.එල්.ඒ.ආරියකිර්ති | A/D | IDB |
| 81 | වෛද්‍ය ඒ.ලතාහරන් | PDHS -CCP | Heath |
| 82 | එම්.වී.රවීන්ද්‍ර | PD | Rural Industry |
| 83 | වෛද්‍ය එස්.ටී.ඒ.පී.සෙරසිංහ | RDHS | RDHS Office |
| 84 | ඉංජී. එස්.ජයාන් | DIE Mahaoya | වාරිමාර්ග |
| 85 | ආර්.එම්. ආරියදාස | DPD | CS?AP |
| 86 | එන්.රාජේෂ් | CIA | Kachcheri |
| 87 | එම්.ඒ.ලාල් කුමාර | SPO | DPCCS-EP |
| 88 | වෛද්‍ය සී.ආර්.ඉසදීන් | RDHS | health |
| 89 | යූ.ඒ.බාරි | EE/Road | RDA |
| 90 | එස්.ආර්.හසිදු | ZDA - Ampara | අධ්‍යාපන |
| 91 | නෙත්තසිංහ | | විශේෂ කාර්ය බලකාය |
| 92 | නිෂාන්ත කුමාර | A/D Planning | UDA |
| 93 | ඩබ්.අයි.විකුමසූරිය | Estate Manager | UDA |
| 94 | කසුන් නිමන්ත | DC ASMP (Ampara) | ASMP |
| 95 | එම්.එච්.එම්. ජබීර් | DDE- ZDA | අධ්‍යාපන |

| | | | |
|---|---|---|---|
| 96 | ඩබ්.ජී.අයි.මධුරංගනී | | සිවිල් ආරක්ෂක |
| 97 | එන්.පී.සී.ටී.නිස්සංක | ZDE | මහඔය |
| 98 | එම්.අයි. ෆව්මි | AD ඉඩම් පරිහරන | Luddp |
| 99 | ඒ.එම්.රහමතුල්ලා | ZDE | අධ්‍යාපන |
| 100 | කමල් නෙත්මිනි | පළාත් පාලන කොමසාරිස් | පළාත් පාලන කොමසාරිස් කාර්යාලය |
| 101 | එම්.අයි.එම්. ෆරීඩ් | HCDO | ACCDS |
| 102 | එම්.ආර්.එම්. ෆරීස් | RME | GSMB |
| 103 | ආර්.පී.ගම්හේවා | NHDA | NHDA |
| 104 | කේ.එල්.ඒ.ආරියකිර්ති | A/D | IDB |
| 105 | පී.උත්තායචන්ද්‍රන් | ප්‍රාදේශීය කළමණාකරු | පොල් වගා කිරීමේ මණ්ඩලය |
| 106 | පී.ජී.එස්.එම්.ගුණසේන | Examinar of motar vehicle | Department of Motar Traffic |
| 107 | එම්.අයි.එම්.නොවුලි | EA | CEB |
| 108 | එම්.එස්.එම්. සප්‍රාස් | අධ්‍යක්ෂ | සමෘර්ධි |
| 109 | ඩී.එම්.ඒ.නෆීල් | | RDHS Kalmunai |
| 110 | ඊ. ක්‍රිස්ටි දේශප්‍රිය | RPM | ID[illegible] |
| 111 | ඩබ්.එම්.එච්.උදය කුමාර | අධ්‍යක්ෂ | EPRPTA Transport |
| 112 | අයි.පී.ඩී.පී. ජයසේකර | Registar | හාඩි කාක්ෂනික ආයතනය |
| 113 | එම්.බී. අලියාර් | PD | මාර්ග සංවර්ධන අධිකාරිය |
| 114 | ඒ.සී.පී.ප්‍රනාන්දු | NAVI (PRO) | SLNS |
| 115 | එස්.පී. තෝරදෙනිය | Co 39 රෙජිමේන්තුව | ශ්‍රී ලංකා ගුවන් හමුදාව උහන |
| 116 | එස්.උදයරාජන් | AD | CE[illegible] |
| 117 | එන් ඒ.එම්.බාරි | OLRG | |
| 114 | එන්.ශ්‍රීරංජන් | AD | ධීවර |
| 119 | ජී.ඩී.ඩී. ලක්මාල් | EE | මාර්ග සංවර්ධන අධිකාරිය |
| 120 | කේ.එල්.එම්.ස්මයිල් | EE | මාර්ග සංවර්ධන අධිකාරිය |
| 121 | ඉෂඩ්.ඒ.එම්. අස්මීර් | EE | මාර්ග සංවර්ධන අධිකාරිය |
| 122 | ඒ.එල්.අයි.බානු | ඉඩම් කොමසාරිස් | ඉඩම් කොමසාරිස් කාර්යාලය |
| 123 | එම්.වී.රවීන්ද්‍ර | PD | Industry |
| 124 | එන්.ආර්.බී.පෙතියායාගොඩ | ලේකම් | නගර සභාව අම්පාර |
| 125 | එස්.පරමේස්වරම් | අධ්‍යක්ෂ | LRC |
| 126 | ඊ.එම්.ඩබ්.ජී.දිසානායක | ලේකම් | MOE |
| 127 | එම්.පී.බහුර්ධීන් | EE | මාර්ග සංවර්ධන අධිකාරිය |
| 128 | ටී.එස්.ඩී.පීරිස් | කලාප අධයාපන අධ්‍යක්ෂ | දෙහිඅත්තකණ්ඩිය කලාප කාර්යාලය |
| 129 | ටී.සිවාස් බාමනියම් | EE | මාර්ග සංවර්ධන අධිකාරිය |
| 120 | ඒ.එල්.නියාස් | DIE | වාරිමාර්ග දෙපාර්තමෙන්තුව |
| 131 | එම්.එච්.ඒ අහමත් | DIE | වාරිමාර්ග දෙපාර්තමෙන්තුව |
| 132 | ජී.එම්.ද සිල්වා | වනජීවී R/A | වනජීවී |
| 133 | වෛද්‍ය එස්.පී.එම්.මාහීර් | DD/APRH | APRH |
| 134 | ඒ.සී.එම්.අල්තාෆ් | DMC | DMC |
| 135 | කේ.එස්.තුෂාර පෙරේරා | DDA | කච්චේරිය |
| 136 | කේ.එල්.ඩී.එස්.පී.සෙනෙවිරත්න | EE | CEB |
| 137 | එම්.එස්.එම්. නවාස් | DIE | වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| 138 | ජී.ඩබ්.ඒ.එස්.ජයසේකර | DEO | අපනයන කෘෂිකරම |
| 139 | එම් පී.එම්. වික්‍රමසිංහ | දිස්ත්‍රික් ක්‍රීඩා නිළධාරී | |
| 140 | යූ.කේ.එම්.මුසාජිත් | ප්‍රාදේශීය කළමනාකරු | NWSDB, ACCP |
| 141 | ආර්.එම්.සිරිවර්ධන | ලේකම් | ප්‍රාදේශීය සභාව - ලාහුගල |
| 142 | අනෝමා රාජපක්ෂ | ලේකම් | ප්‍රාදේශීය සභාව - දමන |
| 143 | එම්.ඒ.පී. මැදගොඩ | ලේකම් | ප්‍රාදේශීය සභාව - උහන |
| 144 | එල්.ජී.අයි.පී.කුමාර | ලේකම් | ප්‍රාදේශීය සභාව - මහඔය |
| 145 | ජී.ජී.ධර්මසීලි | ලේකම් | ප්‍රාදේශීය සභාව - පදියතලාව |

| | | | |
|---|---|---|---|
| 146 | අයි.ජී.එස්.ජී කුමාරි | ලේකම් | ප්‍රාදේශීය සභාව - දෙහිඅත්තගණ්ඩිය |
| 147 | එම්.ඒ.කේ. මොහොමඩ් | ලේකම් | ප්‍රාදේශීය සභාව - සමන්තුරෙයි |
| 148 | එල්.එම්.ඉර්ෆාන් | ලේකම් | ප්‍රාදේශීය සභාව - අක්කරලත්තු |
| 149 | එෆ්. නම්වූ | ලේකම් | ප්‍රාදේශීය සභාව - පොතුවල් |
| 150 | ටී.පරමේෂ්වරම් | ලේකම් | ප්‍රාදේශීය සභාව - නින්දවර් |
| 151 | එස්. පහීරතන් | ලේකම් | ප්‍රාදේශීය සභාව - නාවිදන්වේලි |
| 152 | එම්.ෂබීර් | ලේකම් | ප්‍රාදේශීය සභාව - එරගම |
| 153 | එම්.අය්.එම්. ෆායිස් | ලේකම් | ප්‍රාදේශීය සභාව - අඩ්ඩාලච්චේන |
| 154 | අයි. සුරේස්රම් | ලේකම් | ප්‍රාදේශීය සභාව - අලයාඩිවෙම්බු |
| 155 | ජේ. වීරපතිරණ | ලේකම් | ප්‍රාදේශීය සභාව -තිරුක්කෝවිල් |
| 156 | ඒ.සුන්දරකුමාර් | ලේකම් | ප්‍රාදේශීය සභාව - කාරතිව් |
| 157 | ඒ.ටී.එම්. රෆී | ලේකම් | නගරසභාව - අක්කරපත්තු |
| 158 | ඒ.එල්.එම්.අෂ්මි | ලේකම් | නගරසභාව - කල්මුණ |
| 159 | ඩබ්.ඩබ්. රුවන් | ලේකම් | ප්‍රාදේශීය සභාව - නාමල්ඔය |
| 160 | එස්.ඒ.ජමීල් | ලේකම් | ප්‍රාදේශීය සභාව - නාමල්ඔය |
| | | | |